www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද යුද නැව උතුරු කොරියානු භාණ්ඩ නෞකාවට බැල්ම හෙලයි

## US warship shadows North Korean cargo vessel

ජෝන් චාන් විසිනි
2009 ජුනි 27

මැයි 25 දින සිදුකල උතුරු කොරියාවේ දෙවන න්‍යෂ්ටික අත්හදා බැලීමෙන් පසුව එරටට එරෙහිව සම්බාධක පැනවීමේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල ඇතිවූ ''ඒකමතිකත්වය'' ඔබාමා පරිපාලනයේ පැසසුමට ලක්ව තිබේ. දැන් එන්ට එන්ටම පැහැදිලි වෙමින් ඇත්තේ චීනය හා රුසියාව යෝජනාවට ඡන්දය දුන්නේ එක්සත් ජනපදය හා ජපානය විසින් යොදන පීඩනය මගහැරීමේ පියවරක් වශයෙන් බවය. යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ජාත්‍යන්තර මුහුදේ උතුරු කොරියානු නාවික කටයුතුවලට වැට බැඳීම පිලිබඳව, එක්සත් ජනපදය හා චීනය අතර ආතතීන් පහව ගොස් නොමැත.

උතුරු කොරියාව දිගින් දිගටම කියා ඇත්තේ තම නැව් පිලිබඳව කරන ඕනෑම පරීක්ෂාවක් යුද ක්‍රියාවක් සේ සලකනු ලබන බවය. පසුගිය 25 වන දින බුරුමය බලා යාත්‍රා කල උතුරු කොරියාවේ කැන් නැම් බඩු නැව ගැටුමක ශක්‍යතාව සහිත තැනක් බවට පත්ව තිබේ. ඒ තුල බුරුම ජුන්ටාව සඳහා අවි ගෙන යන්නේ යයි චෝදනා කරමින්, යාත්‍රාව නිරීක්ෂනය සඳහා පෙන්ටගනය විසින් ඩිස්ට්‍රෝයර් යූඑස්එස් මැක්කේන් නැව වහාම පිටත්කර හැරියේය.

මෙම මාසයේ එක්සත් ජාතීන්ගේ යෝජනාවෙන් සුලු ගිනි අවි හැර, උතුරු කොරියාව විසින් සිදු කරන අනෙක් සියලු අවි වෙලඳම තහනම් කලේය. *ෆිනෑන්ෂල් ටයිම්ස්* වෙත කථා කරමින් එක්සත් ජනපදයේ නම හෙලි නොකල ආරක්ෂක නිලධාරියෙකු, යූඑස්එස් මැකේන් කැන් නැම් පරීක්ෂා කිරීමට අදහස් කරන්නේය යන මතය ප්‍රතික්ෂේප කලේය. ඔහු අවධාරනය කලේ ඕනෑම පරීක්ෂාවක් සඳහා නැවේ කොඩිය අයිති රටෙහි එකඟත්වය අවශ්‍ය කෙරෙන එක්සත් ජාතීන්ගේ යෝජනා එක්සත් ජනපදය තදින්ම අනුගමනය කරන බවය. එක්සත් ජනපදය කෙටුම්පත් කල මුල් යෝජනාවට මෙම කොන්දේසිය ඇතුලත් කිරීම සඳහා චීනය හා රුසියාව බලපෑම් කලේය.

කෙසේ වෙතත් මෙම කොන්දේසි නොතකා හල යුතු යයි ජනාධිපති ඔබාමා වෙත ඇමරිකානු සංස්ථාපිතයේ වඩාත් මිලිටරිවාදී කොටස් වෙතින් කෙරෙන බලපෑම වැඩිවී තිබේ. ජුනි 23 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නලය* කැන්නැම් සිංගප්පූරුව පසුකරනවාත් සමඟ පරීක්ෂාවට ලක් කල යුතු බව කියා සිටියේය. ඉරානය හා උතුරු කොරියාවට එරෙහිව බලවත් පියවර ගත යුතු බව කියාසිටි පුවත්පත ''රාජ්‍ය තාන්ත්‍රික බලය පිලිබඳ සිය මැතිවරන ව්‍යාපාරයේ මිත්‍යාවන් කරා ආසු යාමට තමන්ට හැකිනම් යෙහෙකැයි නිසැකව ම ඔබාමා මහතා සිතනවා විය යුතුය. එහෙත් ලෝකයේ දඩබ්බරයන්ට ඔවුන්ගේ ම ප්‍රමුඛතා ඇති අතර ඔවුන් නතර කිරීමට අතට අත දීමට වැඩි යමක් අවශ්‍ය කරවයි.'' යනුවෙන් පවසා ඇත.

දක්ෂිනාංශික බලපෑමට ප්‍රතිචාර දනවමින් ඔබාමා, සීබීඑස් රූපවාහිනිය වෙත ජුනි 22 දින මෙසේ පැවසීය. ''මෙම පරිපාලනය හා අපගේ මිලිටරිය, එලඹෙන ඕනෑම තත්වයකට මුලුමනින්ම සූදානම්ය.'' ඔහු එසේ කියා සිටියේ ඉදිරි සතිවල දී හවායි දෙසට උතුරු කොරියානු මිසයිලයක් එවීමේ හැකියාව පිලිබඳව නැගූ ප්‍රශ්නයකට පිලිතුරු වශයෙනි.

පියෝන්යැන් එක්සත් ජනපදය ඉලක්ක කරන බවට කිසිදු සාක්ෂියක් වොෂින්ටනයෙන් ඉදිරිපත් වී නැත. එහෙත් පෙන්ටගනය බිම සිට ක්‍රියා කරන එහා මෙහා ගෙනයා හැකි මිසයිල ප්‍රතිරෝධක හා රේඩාර් පද්ධතියක් හවායි වෙත යවා තිබේ. එම ස්ථානගත කිරීම අනුමත කරමින් එක්සත් ජනපද ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් ප්‍රකාශ කලේ ''අප කල යුතුව ඇත්තේ කුමක් දැයි නිවේදනය නොකරමින් මා කිව යුත්තේ අවශ්‍යතාවක් පැන නැගුන හොත්, ඇමරිකානු භූමිභාගයන් ආරක්ෂා කිරීමේ ලා අප හොඳ තැනක සිටින බවයි, යනුවෙනි.

කැන් නැම් තහනම් කිරීමේ කුමන එක්සත් ජනපද උත්සාහයක් හෝ එරටට හෝ දකුනු කොරියාවට එරෙහි උතුරු කොරියානු ප්‍රති ප්‍රහාරයක තර්ජනය මතු

කරනු ඇත. හවායිහි මිසයිල ප්‍රතිරෝධකයක් ස්ථානගත කිරීම එවන් සිදුවීමක් සඳහා එක්සත් ජනපද සූදානමේ එක් කොටසක් විය හැකිය. උතුරු කොරියානු නැවට කඩා වැදීම, උතුරු කොරියාව මෙන්ම බුරුමය ද චීන සගයන් වන තතු තුල එක්සත් ජනපදය හා චීනය අතර ආතතීන් උත්සන්න කිරීමට තුඩු දෙනු ඇත.

ගිනිකොන දිග ආසියාවේ නාවික හමුදාවන් සමඟ, පිලිපීනයේ පැරනි එක්සත් ජනපද සුබික් බොක්ක කඳවුර ආන්නයේදී අභ්‍යාසයක් පැවැත්වෙන අතරතුර, චීන සබ්මැරිනයක් සමඟ පැටලීමේ සිද්ධියට මෑතක දී සම්බන්ධ වූයේ ද යූඑස්එස් මැකේන් නෞකාව ය. යූඑස්එස් මැකේන් සෝනා පද්ධතියක් (ශබ්ද තරංග මඟින් දිය යට වස්තූන් සෙවීමේ) ඇදගෙන යන අතරතුර, පෙනීයන පරිදි අභ්‍යාසය නිරීක්ෂනය කිරීම සඳහා එවා තිබුනු, චීන සබ්මැරීනයක් සමඟ ගැටුනේය. මෙම සට්ටනයෙන් පසුව, යූඑස්එන්එස් ඉම්පෙකබල් නමැති ඇමරිකානු ඔත්තු බැලීමේ නෞකාව හා දකුනු චීන මුහුදේ කුඩා චීන වෙරලාරක්ෂක යාත්‍රා සමඟ, තවත් ගැටුමක් හටගත්තේය. මෙම සිදුවීම් ඉස්මතු කරන්නේ බලවතුන් දෙදෙනා අතර නාවික එදිරිවාදීකම්වල ඇති වෙමින් තිබෙන වර්ධනයයි.

උතුරු කොරියානු නාවික යාත්‍රා වෙත කෙරෙන කුමන හෝ ආක්‍රමනික එක්සත් ජනපද මැදිහත්වීම් පිලිබඳව බීජිනය අනතුරු අඟවා ඇත. මෙම සතියේදී චීන විදෙස් අමාත්‍යාංශ ප්‍රකාශක කිං ගැන්ග් කුමන පියවරක් හෝ ගැනීමට පෙර තහනම් ආයුධ වෙලඳමක් පිලිබඳව සෑහෙන තරම් සාක්ෂි තිබිය යුතු යයි අවධාරනය කරමින් ''සංයමයෙන්'' කටයුතු කරන ලෙස කියා සිටියේය.

උතුරු කොරියාව සම්බන්ධයෙන් චීනය, උභතෝකෝටියකට මුහුනපා සිටියි. එක් අතෙකින් සිය සගයා, එක්සත් ජනපදයට හා ජපානය හා දකුනු කොරියාව යන එහි මිතුරන්ට එරෙහිව හොඳ කලාපීය බෆරයක් වෙයි. වොෂින්ටනයට මැදිහත් වීම සඳහා අවස්ථාවක් නිර්මානය කර දෙන පරිදි, පියොන්ග්යෑන් හි ප්‍රධාන අර්බුදයක් හටගන්වන, දඬුවම් සහිත සම්බාධක පැනවීමට චීනය මැලි කමක් දක්වයි. අනෙක් අතට උතුරු කොරියාවේ න්‍යෂ්ටික අත්හදාබැලීම්, චීනයට වලක්වා ගැනීමට අවශ්‍යව ඇති, න්‍යෂ්ටික අවි අත්කර ගැනීම ද ඇතුලුව ජපානය යලි සන්නද්ධ කිරීම සඳහා, නිමිත්තක් වනු ඇත.

චීනයේ විදේශ ප්‍රතිපත්ති සම්පාදනයේ විශේෂඥයින් 20 දෙනෙකුගෙන් සමන්විත *ග්ලෝබල් ටයිම්ස්* රාජ්‍යායතනය විසින් මැයි මාසයේදී පවත්වන ලද සමීක්ෂනයකට අනුව අත්දුටුවේ පියොන්ග්යෑන් තන්ත්‍රයට දඬුවම් පැමිනවීමට ඉන් අඩක් සහාය දැක්වූ බවත් අනෙක් අඩ එයට විරුද්ධවූ බවත් ය. රෙන්මින් විශ්වවිද්‍යාලයේ ෂින් යෙන්හොන්ග් පියොන්ග්යෑන් වෙත ලබාදෙන ආධාර කපාහැරීමටත් දෙරට අතර 1961 දී අත්සන් තැබූ අන්‍යෝන්‍ය ආරක්ෂක ගිවිසුම අවලංගු කිරීමටත් යෝජනා කලේය. පියොන්ග්යෑන් වෙත පීඩනය යෙදීමට ද සහාය දක්වන, ෆූඩාන් විශ්වවිද්‍යාලයේ ෂාන් ඩෙබින් අනතුරු ඇඟවූයේ උතුරු කොරියාවේ කටයුතුවල ප්‍රතිපල වශයෙන් කොරියානු උපමහාද්වීපයේ යුද්ධයක් හටගනු ඇති බවට ය.

සමාජ විද්‍යාව පිලිබඳ චීන ඇකඩමියේ වැන්ග් චෝන් *ග්ලෝබල් ටයිම්ස්* හි පලවූ වෙනම ප්‍රකාශයක් තුල ලියා ඇත්තේ, ''එක්සත් ජනපදයේ ජ්‍යෙෂ්ඨ තානාපති නිලධාරියෙකු සමඟ මා මෑතකදී කල කථාවක් අතරතුර ඔහු පැහැදිලිව ම මා හට පැවසුවේ, කොරියානු උපමහාද්වීපයේ යුද්ධයක් හටගත හොත් එකසත් ජනපදය නියත ලෙසම එයට මැදිහත්වන බවය. මක්නිසාද යත් එහි සගයා වන දකුනු කොරියාව සමඟ එයට ඇති බැඳීම් නිසාය. මම පිලිතුරු වශයෙන් මෙසේ කීවෙමි. 'චීනය හා උතුරු කොරියාව ද එසේම ය. එහි අර්ථය කුමක් දැයි ඔබ දන්නෙහිය.''

චීනය උතුරු කොරියාවට දිගටම ආධාර කල යුතු යයි වැන් අවධාරනය කලේය. ඔහු මෙසේ විමසීය. ''චීනය උතුරු කොරියාවෙන් ඉවත් වුවහොත් පකිස්ථානය කුමක් සිතනු ඇද් ද? චීනයට උතුරු කොරියාව අතරමං කල නොහැකිවීමට තවත් හේතු ද ඇත. එක්සත් ජනපදය සමඟ සෘජු ගැටුමකට පැටලීමෙන් චීනය වලක්වා තබන බෆර් කලාපයක් ලෙස එරට සේවය කරයි.''

චීනයේ ප්‍රධාන එදිරිවාදියා වන ජපානය, එහි අපකීර්තිමත් ප්‍රතිසන්නද්ධ වීම සුජාත කිරීම සඳහා උතුරු කොරියාවේ න්‍යෂ්ටික තර්ජනය ගසාකමින් සිටියි. ජූනි 23 වන දින ආන්ඩුව, අවි ප්‍රවාහනය කරන්නේ යයි සැක කරන බඩු නැව් පරීක්ෂා කිරීමට ජපාන වෙරලාරක්ෂක යාත්‍රාවලට හා නාවික යාත්‍රාවලට ඉඩ දිය යුතුය යන නීතියක් සඳහා යෝජනා ඉදිරිපත් කලේය. එවන් පියවර තුඩු දෙනු ඇත්තේ ඊසාන දිග ආසියාවේ ආතතීන් තවදුරටත් ඇවිලවීමට පමනි.

2010-14 අතර ආරක්ෂක ප්‍රතිපත්ති මඟපෙන්වීම පිලිබඳ කෙටුම්පත මිලිටරි වියදම් හා හට සංඛ්‍යාවන් අඩු කිරීමට කලින් යොදා තිබූ අවධානය ඉවත් කර ඇති බව කියෝඩෝ ප්‍රවෘති සේවය වාර්තා කලාය. *ඒෂියා ටයිම්ස්* පුවත්පතට අනුව පාලක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එල්ඩීපී) ආරක්ෂක ප්‍රතිපත්ති මන්ඩලයේ අනු කමිටුවක්, උතුරු කොරියානු න්‍යෂ්ටික අත්හදාබැලීමට පසු දින මඟපෙන්වීම සඳහාවූ පිටු 12 ක යෝජනාවලියක් නිකුත් කර තිබේ. සතුරු රාජ්‍යයක හඳුනාගත් මිසයිල මධ්‍යස්ථානවල මිසයිල විදීමේ කුමන හෝ සූදානමකට එරෙහිව ජපානය, පූර්වභංග කෘෂස් මිසයිල ප්‍රහාර එල්ල කල යුතු යයි එය තර්ක කර තිබේ.

අනෙකුත් රටවලට එරෙහිව බලය යෙදීම, ජපානයේ ඊනියා සාමකාමී ව්‍යවස්ථාව යටතේ නිල වශයෙන් වලක්වා තිබුන ද, එරට අගමැති තාරෝ අසෝ තර්ක කරන්නේ මිසයිල් මධ්‍යස්ථාන ඉලක්ක කිරීමට අවසරයක් ඇති බවට ය. ඔහු මෑතක දී පාර්ලිමේන්තුව අමතා ප්‍රකාශ කලේ ''වෙනත් කිසිදු විකල්පයක් නොමැති බවට සාක්ෂි පවතිනාතාක් දුරට, සතුරාගේ මිසයිල් මධ්‍යස්ථාන වෙත පහරදීම ව්‍යවස්ථාව මඟින් සහතික කර තිබේ. එය ගැනෙන්නේ ආත්මාරක්ෂක පියවරක් ගනයටය.''

උතුරු කොරියාවේ අපරීක්ෂාකාරී ක්‍රියාවන් මඟින් සිදුවන්නේ, එක්සත් ජනපදයේ, ජපානයේ හා දකුනු කොරියාවේ දක්ෂිනාංශික බලවේගයන්ගේ අත ශක්තිමත් කිරීම පමනකි. එය සතු සීමිත න්‍යෂ්ටික හා මිසයිල් ශක්තිය එරටට ආරක්ෂාව සලසනු වෙනුවට, එක්සත් ජනපදය හා එහි කලාපීය සගයන් විසින් යොදාගනු ඇත්තේ මිලිටරි තරකිරීමට හා තව තවත් ප්‍රකෝපකාරීත්වයන් සඳහා නිමිත්තක් ලෙස පමනි. එක්සත් ජනපද ආක්‍රමනිකයා සිතියමෙන් ''අතුගා දැමීම'' පිලිබඳ පියෝන්යැන්හි පුරසාරම්වලට ප්‍රතිචාර වශයෙන් පෙන්ටගන් ප්‍රකාශක ජෆ් මොරෙල් එම තර්ජනය ''මෝඩකම්'' ලෙස කෝපයෙන් බැහැර කලේය.

වර්තමානයේදී වොෂින්ටනයේ අරමුනව ඇත්තේ උතුරු කොරියාව හික්මවා ගන්නා ලෙස බීජිනයට බලපෑම් කිරීම බව පෙනෙන්නට තිබේ. කෙසේ වෙතත්, නිදසුනක් ලෙස උතුරු කොරියානු නැවට ගොඩබැසීම වැනි වැරදි ගනන් බැලීම්, ප්‍රධාන බලවතුන් ද ඇදී ආ හැකි ගැටුමක් තුලට ඇදී යා හැකි පාලනය කර ගත නොහැකි වේගවත් සර්පිලයක විභවයක් ගැබ්කර ගනියි.

© www.wsws.org